## කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

## මාතර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 25 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අගෝස්තු 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණ නිරීක්ෂණය විය.

(අ) සභාවේ ආරම්භයේ සිට ඉකුත් වර්ෂය අවසානය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2010 දී පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් නැවත සකස් කර නිවැරදි කිරීම් කර තිබුණි. මේ හේතුව නිසා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ වෙනස්වී තිබණි. වෙනස රු.42,149,835 ක් වූ අතර ඒ සඳහා ජර්නල් සටහන් මගින් ගිණුම් වලට වූ බලපෑම් නිවැරදි කිරීමකින් තොරව සංශෝධිත ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දක්වා තිබුණි.

(ආ) පිළිවෙලින් රු.670,828 ක් හා රු.39,813 ක් වූ දේපල හා යතුරුපැදි ණය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඇ) වෙන වෙනම පැවැත්විය යුතු මුද්දර ගාස්තු ලැබීම් හා උසාවි දඩ ලැබීම් එකම ගිණුමක පවත්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය සඳහා විගණන ගාස්තු ප්‍රතිපාදනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදිත රු.60,000 ක් වූ විගණන ගාස්ත, පොලී ලාභාංශ හා ප්‍රසාද මුදල් ගිණුමට හර කර තිබුණි. මේ හේතුවෙන් ගෙවිය යුතු මුළු විගණන ගාස්තු ණයහිමි ලේඛණයේ සටහන් වීම අත්හැර තිබුණි.

(ඉ) ලී බඩු හා උපකරණ යටතේ ගිණුම් ගතකල යුතු රු.4,400 ක් වටිනා ගණක යන්ත්‍ර දෙකක් හා රු.2,720 ක් වටිනා පාරිභෝගික භාණ්ඩ වර්ග තුනක් සදොස් ලෙස යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඊ) බැංකු ගිණුම් දෙකකට අයත් රු.3,360 ක් වූ චෙක්පොත් ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා නොතිබුණි.

(උ) වෙනත් ආදායම් ගිණුමට බැර විය යුතු රු.17,452 ක ජල බවුසරයේ රක්ෂණ ලැබීම් සදොස් ලෙස මුද්දර ගාස්තු ගිණුමට බැර කර තිබුණි.

(ඌ) 2008 හා 2009 වර්ෂ වලට අදාල දේපල ණය සඳහා ලැබුණු රු.117,304 ක් වූ රාජ්‍ය දායකය ජර්නල් සටහන් 7 මගින් උසාවි දඩ හා මුද්දර ගාස්තු ගිණුමට හර කර තිබුණි.

1.3.2 නොසැසඳු ගිණුම්.

මූල්‍ය ප්‍රකාශන අනව ගිණුම් විෂයයන් 12 ක ගිණුම්වල දැක්වෙන වටිනාකමත්, ඊට අදාල උපලේඛණ අනුව දැක්වෙන වටිනාකමත් අතර රු.12,453,311 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

ගිණුම් විෂයයන් 09 කට අයත් රු.36,464,671 ක් වටිනා ශේෂයන් සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා, අයිතිය හා පැවැත්ම තහවුරු කෙරෙන ලිපිලේඛණ, උපලේඛණ, ශේෂ තහවුරු කිරීමේ ලිපි, කාල විශ්ලේෂණ ආදිය නොමැතිකමින් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 145 | එක් එක් තැන්පතු වර්ගය වෙනුවෙන් ඇති මුදල් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් එක් එක් වර්ෂය අවසානයේ පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හ තථ්‍ය ශේෂය සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 396(ඇ) | මාස 06 ක් ඉකුත් වී තිබූ නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල රු.10,729 ක් වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) අංක 08/2005 හා 2005 මාර්තු 31 දිනැති | දේපල ණය සඳහා රාජ්‍ය දායකය රජය විසින් දරනු |

| | |
|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ලැබිය යුතු වුවද රු.83,533 ක මුදලක් සභා අරමුදලින් දරා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්ථන ආදායම ඉක්මවූ වියඋම රු. 1,463,749 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු. 768,568 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011මාර්තු 03 දිනැති මාගේ ලිපියට අනුව නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු නිරවද්‍ය නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශය අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්වය ඉකුත් වර්ෂය සමඟ සසදා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 | 2009 | | |
| | රු. | රු. | % | % |
| | '000 | '000 | | |
| ආදායම් ණයගැතියෝ | 22,783 | 26,529 | - | 14.12 |
| වරිපනම් බදු | 329 | 292 | 12.67 | - |
| අක්කර බදු | 94 | 91 | 3.29 | - |
| උසාවි දඩ හා මුද්දර ගාස්තු | 925 | 183 | 405.46 | - |
| බදු කුලී | 1,724 | 1,198 | 43.90 | - |
| බලපත්‍ර ගාස්තු | 167 | 164 | 1.82 | - |

#### 2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාලව අයවිය යුතු රු.26,119,140 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 කඩ කාමර කුලී 50% ක් කපා හැරීම

ප්‍රාදේශීය සභාවේ කඩ කාමර කුලී අය කිරීම සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී කඩ කාමර 14 ක් සඳහා 2009 වර්ෂය සඳහා තක්සේරු කර ඇති කුලී මුදලින් 50% ක කුලිය කපා හැරීමට 2010 ඔක්තෝබර් 30 දින පැවති සභා රැස්වීමේදී තීරණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) මෙම 50% ක තක්සේරුගත මුදල කපා හැරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට 2010 අප්‍රේල් 12 දින ඉල්ලුම් කර තිබුණද 2011 මැයි 31 දින වන විටත් අදාල අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය පරිදි අයවිය යුතු මුදලක් අත්හැරිය හැක්කේ මුදල් ප්‍රමාණයේ නොවැදගත්කම, අයකර ගැනීමට නොහැකිවීම, හෝ එම තැනැත්තන්ගේ දුප්පත්කම යන හේතු මත පමණි. මෙම කඩකාමර කුලී කපා හැරීම එකී අවස්ථාවන්ට අදාල නොවූ හෙයින් ලැබිය යුතු ආදායම කපා හැරීම එකී වගන්තියේ විධිවිධානවල පටහැනි විය.

(ඇ) 2009 ජනවාරි 01 සිට 2009 දෙසැම්බර් 31 දින දක්වා කඩ කාමර 14 කින් අයකරමට තිබූ 50% ක කඩ කුලි මුදලින් රු.363,480 ක්ද සමඟ අයවිය යුතු සම්පූර්ණ කඩ කුලිය රු.1,079,003 ක් විය.

2.2.4 <u>ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය ගාස්තු අයවීම.</u>

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය වන ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය, ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 පෙබරවාරි 12 දිනැති අංක 1641 දරණ ගැසට් පත්‍රයෙන් හා 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත පරිදි ගාස්තු පනවා තිබූ අතර 2011 වර්ෂය සඳහා 2010 ඔක්තෝබර් 29 දිනැති මහා සභාවෙන් ගාස්තු පනවා තිබුණද 2011 ජුනි 02 දින වන විටද එම ගාස්තු පැනවීම ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ නියැදියක් ලෙසට තෝරාගත් ප්‍රදේශයක ප්‍රදර්ශනය වෙමින් තිබූ ස්ථිර දැන්වීම් පුවරු පිළිබඳව ආදායම් පරීක්ෂක සමඟ 2011 ජුනි 02 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී ස්ථිර දැන්වීම් පුවරු 23 ක් ප්‍රදර්ශනය වෙමින් පැවතිණි. එකී දැන්වීම් වලින් අයවිය යුතු රු.22,630 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. මෙම දැන්වීම් 2010 වර්ෂයේ සිට ප්‍රදර්ශනය වෙමින් පවතින ඒවා බවද නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකිරීම් සටහන් කිරීමේ ආදායම් ලේඛණයක් පවත්වා නොතිබුණෙන් සභා බල ප්‍රදේශයේ ගාස්තු අයවීම් ප්‍රමාණය පිළිබඳව තහවුරු කර ගත නොහැකි විය.

(ඈ) අංක 1641 ගැසට් පත්‍රය හා 2011 වර්ෂය සඳහා යෝජිත ගැසට් පත්‍රයේ පරිදි උපලේඛණයක් මගින් පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පනවා තිබණද එකී උපලේඛණ පරිදි ගාස්තු අයකර ගෙන නොතිබුණි.

- ❖ විශාල ප්‍රමාණයේ ප්‍රදර්ශන පුවරු (කටවුට්)
- ❖ රෙදි උපයෝගී කර ගනිමින් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම
- ❖ බිත්ති හෝ ගොඩනැගිලි උපයෝගී කර ගනිමින් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.
- ❖ කුඩා ප්‍රදර්ශන පුවරු (කටවුට්)

2.2.5 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා තිබූ රු.108,667 ක් වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.6 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු. 278,350 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 10,869 | 8,092 | 2,777 | 10,597 | 7,910 | 2,687 |
| අනෙකුත් | 4,707 | 2,156 | 2,551 | 3,988 | 2,120 | 1,868 |
| උප එකතුව | 15,576 | 10,248 | 5,328 | 14,585 | 10,030 | 4,555 |
| ප්‍රාග්ධන වියදම | 7,577 | 38,386 | (30,809) | 85,345 | 33,588 | 51,757 |
| මුළු එකතුව | 23,153 | 48,634 | (25,481) | 99,930 | 43,618 | 56,312 |

2.4 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 (වැඩ බලන ලේකම්) |
| ද්විතියික | 11 | 12 |
| ප්‍රාථමික | 08 | 10 |

වෙනත් (අනියම්, තාවකාලික, කොන්ත්‍රාත්, ආදේශක) - 16

(i) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් සඳහා වූ වියදම රු.8,378,430 ක් වුවද, පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.6,550,291 ක් පමණක් හෙයින් සභාවට රු. 1,828,139 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ii) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14, හා අංක 28 මගින් පළාත් පාලන ආයතන වල නිලධාරීන් අනියම්, ආදේශක, හා කොන්ත්‍රාත්, සේවකයන් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධානවලට පටහැනිව සේවකයන් 19 ක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සහා අරමුදලින් රු.1,347,187 ක මුදලක් ගෙවා තිබුණි.

2.5 පෙර ගෙවුම්.

2010 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවුම් වල රු.28,600 ක ශේෂයක් පැවතුනි.

2.6 වත්කම් කළමනාකරණය

2.6.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජන භෞතික සම්පත්.

වත්කම් පවරා දීමේදී කඹුරුපිටිය ප්‍රාදේශය සභාවෙන් ලැබී තිබූ රු.79,400 ක් වටිනා කුබෝටා අත් ට්‍රැක්ටරයක් භාවිතයට ගැනීමකින් තොරව සහා භූමියේ දිරාපත් වෙමින් තිබුණි.

2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.112,147 ක් විය.

2.6.3 භාණ්ඩ සමීක්ෂණය.

සමාලෝචිත වර්ෂයට අදාල විගණනයට ඉදිරිපත් කල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් නොවීය.

(ii) භාණ්ඩ වර්ග 11 කට අයත් අතිරික්ත ප්‍රමාණය 38 ක්ද, භාණ්ඩ වර්ග 28 කට අයත් ඌණතා ප්‍රමාණය 63 ක්ද වූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) සමීක්ෂණ මණ්ඩල නිර්දේශය මගින් පුස්තකාල වල පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කර ඒවා විධිමත් කර ගන්නා ලෙසට වාර්තා කර තිබුණද ඒ අනුව කටයුතු කල බවට තොරතුරු නොවීය.

- ❖ පුස්තකාල පොත් භාර ගැනීම හා නිකුත් කිරීම විධිමත්ව නොකිරීම.
- ❖ සමාලෝචිත වර්ෂයේදී රු.2,943 ක් වටිනා පොත් 49 ක ඌණතාවයක් වූ අතර සෑම වසරකම පුස්තකාල පොත් සැලකිය යුතු ප්‍රමාණයක් සමීක්ෂණයට ඉදිරිපත් කිරීමට වගකිවයුතු නිලධාරීණිය අපොහොසත් වීම.

- ❖ පුස්තකාලය පවත්වාගෙන යාම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් නොතිබීම.
- ❖ පොත් අලුත්වැඩියා කිරීම සඳහා උපකරණ තිබුණද පොත් අලුත්වැඩියා නොකිරීම නිසා අබලිවීම ඉක්මන් වීම.
- ❖ පාඨකයින් රැගෙන ගොස් ආපසු භාර නොදුන් පොත් නැවත ගෙන්වා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2.7.1 දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු මුදල්.

ප්‍රාදේශීය සභාව විසින් අයකර ගන්නා ලද රු.217,801 ක් වූ එකතු කළ අගය මත බදු මුදල් සහ රු.7,562 ක් වූ මුද්දර බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2011 ජුනි 01දිනැති විගණන පරීක්ෂණ දිනය වන විටත් රු.225,363 ක් වූ මුදල ප්‍රේෂණය කර නොතිබුණි.

2.7.2 වීථි පහන් නඩත්තුව හා පාලනය.

වීථි පහන් නඩත්තුව හා පාලනයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වීථි පහන් නඩත්තුව සඳහා විදුලි උපාංග මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පරිදි නඩත්තු විදුලි කාර්මිකගේ ඉල්ලීම හා ඒ සඳහා කාර්මික නිලධාරියාගේ අනුමැතිය තුලින් ඒවා මිලදී ගැනීම සිදු කළ යුතු වුවත් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) වීථි පහන් සවිකර ඇති ස්ථාන පිළිබඳ දළ සැලැස්මක් පවත්වා නොතිබුණි. වගකීමේ කාලයක් සහිත විදුලි පහන් මිලදී ගෙන වීථි පහන් වලට සවිකර තිබුණද ඒ පිළිබඳ ලේඛණයක් පවත්වා නොතිබුණි.

(iii) සභා බල ප්‍රදේශය තුල නඩත්තුව සිදුවන වීථි පහන් එකිනෙක වෙන්කොට හඳුනා ගැනීමේ පහසුව සඳහා සංකේත ක්‍රමයක් භාවිතා කර නොතිබුණි.

(iv) 2011 ජුනි 02 විගණන දනය වන විට විදුලි බල මණ්ඩලයෙන් අනුමත වීථි පහන් වලට වඩා පහන් 696 ක් වැඩිපුර සවිකර තිබුණි.

(v) 2010 වර්ෂය තුල වීථි පහන් සවිකිරීම් සඳහා උපකරණ වෙනුවෙන් රු.264,520 ක්ද නඩත්තුකරුට රු.90,350 ක්ද වශයෙන් එකතුව රු.354,870 ක් සභාව විසින් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා රු. 12,960 ක මුදලක් පමණක් ප්‍රතිපූර්ණය වී තිබුණි.

2.7.3 ගෘහස්ත කොම්පෝස්ට් බදුන් ව්‍යාපෘතිය.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ගෘහස්ථ කොම්පෝස්ට් බදුන් බෙදාදීමේ ව්‍යාපෘතිය යටතේ බදුන් 150ක් බෙදාදීමට ඉලක්ක කර 2007 හා 2008 වර්ෂවල බදුන් 100 ක් රු.250,000 කට මිලදීගෙන බෙදාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.60,000 ක් වැයකර මිලදී ගත් බදුන් 50 කින් රු.28,800 ක් වටිනා බදුන් 24 ක් 2011 ජුනි 02 දින වන විටද බෙදාදීමකින් තොරව සභා අංගනයේ තබා තිබුණි.

2.8 කොන්ත්‍රාත් පාලනය.

---

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා පුස්තකාලය ඉදිකිරීම පළමු අදියර
හා දෙවන අදියර (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන)

---

සභාවේ පුස්තකාලය ඉදිකිරීම සඳහා පළමු අදියර යටතේ රු.2,832,694 ක් වටිනා ඇස්තමේන්තුවක්ද, දෙවන අදියර සඳහා රු.1,100,000 ක් වටිනා ඇස්තමේන්තුවක්ද පිළියෙල කර තිබුණි. පළමු අදියර ඇස්තමේන්තුව සඳහා 2007 නොවැම්බර් 26 දින කිරින්දමගින්ඉහල දකුණ ගොවි සංවිධානය සමඟ රු.1,997,049 ක් වටිනා ගිවිසුමක්ද, දෙවන අදියර සඳහා එම ගොවි සංවිධානය සමඟම 2010 දෙසැම්බර් 02 දින රු.1,060,701 ක් වටිනා ගිවිසුමක්ද අත්සන් කර 2010 ජුනි 21 දින පළමු අදියර සඳහා කල වැඩ වටිනාකම වෙනුවෙන් රු.1,715,919 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) විෂයයන් 07 ක් සඳහා ගිවිසුම් ගත ප්‍රමාණයට වඩා වැඩ ඉටකල බව දක්වමින් රු.333,173 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණද එකී වැඩිපුර ගෙවීම් සඳහා ටෙන්ඩර් මණ්ඩලයේ හා සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ii) ගිවිසුම්ගත වැඩ උපලේඛණයේ අංක සී-31 ලෙසට විෂයයක් දක්වා නොතිබුණද ගෙවීම් කිරීමේදී එකී විෂයය යටතේ කුළුණු කයිරු බීම් හා බීම් සඳහා මි.මී. 6 ප්‍රමාණයේ කම්බි නමා බැඳීම වෙනුවෙන් කි.ග්‍රෑ. 274.45 ක් සඳහා රු.31,287 ක් ගෙවා තිබුණි.

(iii) ගිවිසුමේ කොන්දේසි අංක 04 පරිදි කර්මාන්තයේ වැඩ මාස 4 කින් එනම් 2008 මාර්තු 26 දිනට නිමවිය යුතු වුවත් කොන්ත්‍රාත්කරුට කම්කරුවන් නොමැතිවීම, අධික වර්ෂාව, ගල්, වැලි යනාදී තැනීම් ද්‍රව්‍ය සපයා ගත නොහැකිවීම වැනි හේතු දක්වමින් කොන්ත්‍රාත් කාලය වර්ෂයක් දක්වා දීර්ඝ කරවාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරුගේ මෙම ඉල්ලීම් ලිපිවලට සභා දිනමුද්‍රාව තබා නොතිබූ අතර කාලය දීර්ඝ කිරීම නිර්දේශ කල ලිපිවල තාක්ෂණ සේවා නිලධාරිණියගේ හා අනුමත කල සභාපතිවරයා දිනයන් යොදා අත්සන් තබා නොතිබූ හෙයින් මෙම ඉල්ලීම් ලිපිවල විධිමත් භාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

(iv) ගොඩනැගිල්ලේ ඉහල මාලය ඉදිකිරීම සඳහා ඉතිරි කර තිබූ කම්බි කොටස් නිරාවරණය වී දිරාපත් වෙමින් තිබුණි.

(v) 2010 දෙසැම්බර් 02 දින අත්සන් කල ගිවිසුමේ අංක 03 කොන්දේසිය පරිදි කර්මාන්තයේ වැඩ 2011 මාර්තු 02 දින නිම විය යුතු විය. කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා නොතිබූ අතර විෂය අංක 06 හි 1.2 අනුව බදාම මිශ්‍රණයෙන් 12'x12' ප්‍රමාණයේ ටයිල් ඇතිරීම, විෂය අංක 07 හි මි.මී. 5 ක් ඝනකම වීදුරු සවිකර ජ්.අයි. රාමුව සහිත ඇලුමිනියම් වෙන් කිරීම යන විෂයන් 2011 ජුනි 02 දින වන විටද නිමකර නොතිබුණෙන් ගිවිසුම් කොන්දේසි අංක 04 පරිදි ප්‍රමාද සති 10 ක් සඳහා රු.18,560 ක ප්‍රමාද දඩ අයකර ගත යුතුව තිබුණි.

(vi) මෙම කර්මාන්තය සඳහා අදියර දෙකක් යටතේ 2007 සහ 2010 වර්ෂවල රු.3,057,750 ක් වටිනා ගිවිසුම් දෙකක් අත්සන් කර 2011 ජුනි 02 දින වන විට රු.1,715,919 ක් වැයකර

ඇතත් කර්මාන්තයේ වැඩ මෙතෙක් නිමකර නොමැති හෙයින් ගොඩනැගිල්ල පුස්තකාලයක් ලෙසට මහජනයාට භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

(vii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක පුස්තකාල ගොඩනැගිල්ල සඳහා රු.3,057,750 ක ගිවිසුම් අත්සන් කර රු.1,715,919 ක් සහා අරමුදලින් වැයකර ඇතත් පළාත් පාලන කොමසාරිස් වෙතින් 2011 ජුනි 02 දින වන විට ප්‍රතිපාදන ලැබී තිබුණේ රු.1,454,647 ක් පමණක් හෙයින් හිඟ හිටි ප්‍රතිපාදිත මුදල රු.1,603,103 ක් විය.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පාලනය
(ඈ) ස්ථාවර වත්කම්
(ඉ) වියදම් පාලනය